ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය	පුරවැසි අධ්‍යාපනය - I, II	කාලය: පැය 03 යි

අමතර කියවීම් කාලය

මිනිත්තු 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

පුරවැසි අධ්‍යාපනය I

උපදෙස්

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගන්න.
- ඔබට සැපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

1. වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල් පාලනය සඳහා යොදාගෙන ඇති පාලන ක්‍රමය වන්නේ,

   (1) සමාජවාදී පාලන ක්‍රමය
   (2) ධනවාදී පාලන ක්‍රමය
   (3) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය
   (4) පැසිස්ට්වාදී පාලන ක්‍රමය

2. ක්‍රි.ව.15 වන සියවසෙන් පසුව ඉඩම් හුක්තිය හා බැඳුණු සේවාවන් සැපයීම මත පදනම් වූ කෘෂි ආර්ථික රටාව වෙනුවට, ආරම්භ වූ ආර්ථික රටාව,
   (1) ධනවාදී ආර්ථික රටාව
   (2) ආනයන ආර්ථික රටාව
   (3) අපනයන ආර්ථික රටාව
   (4) වාණිජ ආර්ථික රටාව

3. ආණ්ඩුවේ නීති සම්පාදනය, නීති ක්‍රියාවට නැංවීම සහ යුක්තිය පසිඳලීම යන කාර්යයන් කෙරෙන ආයතන අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
   (1) ව්‍යවස්ථාදායකය, ජනගහනය, විධායකය
   (2) භූමිය, ජනගහනය, ස්වාධිපති බලය
   (3) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය
   (4) භූමිය, විධායකය, අධිකරණය

4. ප්‍රජාතන්ත්‍රවාදී පුරවැසියෙකු සතු විය යුතු වැදගත් ගුණාංගයක් නොවන්නේ,

   (1) නීතිගරුක වීම
   (2) විරුද්ධ මත දැරීම
   (3) අයිතිවාසිකම් වලට ගරු කිරීම
   (4) බහුතර මතයට ගරු කිරීම

5. නීතිය යනු රාජ්‍ය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ පද්ධතියක් ලෙස දැක්වූයේ,
   (1) ටී.එච් ග්‍රීන්
   (2) ජෝන් ඔස්ටින්
   (3) මහාචාර්ය ගානර්
   (4) ඇරිස්ටෝටල්

අධ්‍යාපන ගුරු සංසදය

6. ජී. මාර්ෂල් මහතා විසින් නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග 3 ක් දක්වා ඇත. ඊට අයත් නොවන පිළිතුර තෝරන්න.
(1) සෑම කෙනෙකුම රටේ නීතියට යටත් වීම
(2) ස්වාධීන අධිකරණයක් මගින් සෑම දෙනාටම සර්ව සාධාරණව නීතිය ක්‍රියාත්මක කිරීම.
(3) අපක්ෂපාතී, නිශ්චිත, සාධාරණ හා යුක්ති සහගත පොදු නීති පද්ධතියක් තිබීම.
(4) වරින් වර ඉතා පහසුවෙන් වෙනස් කර ගත හැකි සරල නීති පද්ධතියක් තිබීම.

7. ශ්‍රී ලංකාවේ ඇති අධිකරණ දිස්ත්‍රික්ක ගණන දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ

(1) විසිදෙකකි (2) විසිපහකි

(3) පනස්දෙකකි (4) පනස්හතරකි

8. මුස්ලිම් නීතියට අනුව නඩු විසඳීම සඳහා පළමුවරට කාති උසාවි පිහිටුවන ලද්දේ,
(1) ක්‍රි.ව.1929 දී (2) ක්‍රි.ව.1939 දී

(3) ක්‍රි.ව.1706 දී (4) ක්‍රි.ව.1806 දී

9. රටක ක්‍රියාත්මක වන පරමාධිපත්‍යය බලයේ අවසාන හිමිකරුවා වන්නේ,
(1) විධායකය (2) ව්‍යවස්ථාදායකය

(3) මහජන නියෝජිතයින් (4) මහජනතාව

10. ස්විස්ටර්ලන්තය තුළ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු නම් කර ඇත්තේ,
(1) ප්‍රාන්ත ලෙස (2) කැන්ටන් ලෙස

(3) පළාත ලෙස (4) ප්‍රදේශ ලෙස

11. ඒකීය ආණ්ඩුක්‍රම පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) ශ්‍රී ලංකාව, ප්‍රංශය (2) ශ්‍රී ලංකාව, ඇමරිකාව

(3) ඇමරිකාව, ඉන්දියාව (4) ඇමරිකාව, බ්‍රිතාන්‍යය

12. පහත සඳහන් කරුණු අතරින් මධ්‍යම ආණ්ඩුවට පමණක් හිමි කාර්යය වනුයේ,
(1) ජාතික නිවාස හා ඉදි කිරීම (2) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන

(3) සමාජ සේවා හා පුනරුත්ථාපන (4) කෘෂිකර්මය හා ගොවිජන සේවා

13. අනුරාධපුර යුගයේ අගභාගය වන විට මෙරට දක්නට ලැබුණු පාලන ඒකක වන්නේ,
(1) උත්තර පස්ස, ප්‍රාචීන පස්ස, දක්ඛිණ පස්ස
(2) රජරට, රුහුණු රට, මලය රට
(3) රජරට, දක්ඛිණ දේශය, දොලොස්දහස් රට
(4) දිසාව, කෝරලි, පත්තු

14. නිලලත් මන්ත්‍රීන් 11 ක් හා නිල නොලත් 10 ක්ද, ඒ අතර ඡන්ද බලයෙන් 4 ක් තෝරාපත් කරගත් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,
(1) කෝල්බෘක් (2) කෘෘව් මැකලම්

(3) මැනිං (4) ඩොනමෝර්

15. මේ අතරින් උතුරු පළාතට අයත් දිස්ත්‍රික 2ක් නිවැරදිව දක්වා ඇත්තේ,
(1) කළුතර, පුත්තලම (2) මහනුවර, කෑගල්ල

(3) මුලතිව්, මඩකලපුව (4) මන්නාරම, වවුනියා

16. උෆව පළාත තුළ පිහිටුවා ඇති ප්‍රාදේශීය සභා ගණන වන්නේ,
(1) 25 කි (2) 28 කි

(3) 29 කි (4) 33 කි

ශ්‍රීලංකා අධ්‍යාපන ඔඩියෝසංකදය

17. පහත සඳහන් රාජ්‍යයන් අතරින් ඉතාම සංකීර්ණ බහු සංස්කෘතික රාජ්‍යයක් වනුයේ,
(1) ශ්‍රී ලංකාව (2) ඉන්දියාව
(3) පාකිස්ථානය (4) බංග්ලාදේශය

18. බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ජනයාගේ ආගමික ස්ථාන නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ,
(1) පන්සල, කෝවිල, පල්ලිය (2) කෝවිල, පල්ලිය, පන්සල
(3) පල්ලිය, පන්සල, කෝවිල (4) කෝවිල, පන්සල, පල්ලිය

19. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපෑ ආක්‍රමික කණ්ඩායම වනුයේ,
(1) විජය ඇතුළු පිරිසගේ පැමිණීම (2) පඬුවස්දෙව් ඇතුළු පිරිසගේ පැමිණීම
(3) මිහිඳු හිමි ඇතුළු පිරිසගේ පැමිණීම (4) යුරෝපා ජාතීන්ගේ පැමිණීම

20. "එක මවකගේ දරු කැල බැවිනා" යනුවෙන් අපට නිතර ඇසෙනුයේ,
(1) දහම් පාසලේ ගීතයෙන් (2) පාසල් ගීතයෙන්
(3) පළාත් ගීතයෙන් (4) ජාතික ගීතයෙන්

21. අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් ක්‍රි.ව. 1689 දී සිදුවූයේ,
(1) බ්‍රිතාන්‍ය මැග්නා කාර්ටා ගිවිසුම (2) බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත
(3) ඇමරිකානු නිදහස් ප්‍රකාශනය (4) රුසියානු විප්ලවය

22. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳව අන්තර්ජාතික සම්මුතිය 1966 දී සම්මත කර ගන්නා ලදී. ඊට අයත් නොවන වගන්තිය තෝරන්න.
(1) ජීවත්වීමේ අයිතිය
(2) අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමේ අයිතිය
(3) නීතිය හමුවේ පුද්ගලයකු ලෙස පෙනී සිටීමේ අයිතිය
(4) මැතිවරණයකදී ඡන්දය දීමේ අයිතිය

23. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සඳහා පදනම් කරගත් මූලධර්ම හතරට අයත් නොවන කරුණ වන්නේ,
(1) ළමයාගේ උපරිම යහපත (2) වෙනස් කොට සැලකීම
(3) පැවැත්ම සහ සංවර්ධනය (4) සහභාගීත්වය

24. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ සේවයෙන් විශ්‍රාම ගතවන වයස් සීමාව වනුයේ,
(1) අවුරුදු 50 - 55 (2) අවුරුදු 55 - 60
(3) අවුරුදු 53 - 57 (4) අවුරුදු 58 - 62

25. පහත සඳහන් දෑ අතරින් ආර්ථික භාණ්ඩයක් වනුයේ,
(1) හිරු එළිය (2) ගංගා ජලය
(3) බෝතල් කළ ජලය (4) හමායන වාතය

26. ශ්‍රී ලංකාවේ දුම්රිය සේවාව පවත්වාගෙන යනු ලබන්නේ,
(1) රාජ්‍ය අංශය මගින්
(2) පෞද්ගලික අංශය මගින්
(3) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ එකතුවෙන්
(4) විදේශ සමාගම් මගින්

27. එදිනෙදා භාවිතයට ගන්නා ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම්, ඖෂධ ආදිය අයත්වනුයේ,
(1) පාරිභෝගික භාණ්ඩවලටය (2) අන්තර් භාණ්ඩවලටය
(3) ප්‍රාග්ධන භාණ්ඩවලටය (4) වෙළඳ භාණ්ඩඩවලටය

28. පරිවර්තන ආර්ථිකයක ලක්ෂණයක් නොවන්නේ,
(1) පාඩු ලබන රාජ්‍ය ව්‍යවසාය ශක්තිමත් කිරීම
(2) පෞද්ගලික ව්‍යවසායන් දිරිගැන්වීම
(3) පෞද්ගලික දේපළ අයිතියට ඉඩ සලසා දීම
(4) ආර්ථිකය ලිහිල්කරණය

අධ්‍යාපනය ගුරු සේවය

29. වායු දූෂණය සිදුවන ස්වභාවික ක්‍රමයක් නොවන්නේ,
(1) ගිනිකඳු පිපිරීම (2) ලැව් ගිනි
(3) දූවිලි කුණාටු (4) ප්‍රවාහන කටයුතු

30. සමාජ පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵලයකි.
(1) සමාජ සබඳතා ගොඩනැගීම
(2) සමාජ ආසාධාරණකම් තුරන් වීම
(3) සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම
(4) දෙමාපිය දූදරු සම්බන්ධතා වර්ධනය වීම

31. සංවර්ධනය මනිනු ලබන මිනුම් ක්‍රම දෙකකි. ඉන් සම්ප්‍රදායික මිනුම් ගණයට ඇතුළත් වනුයේ,
(1) මානව සංවර්ධන දර්ශකය (2) මූර්ත දළ ජාතික නිෂ්පාදනය
(3) අන්තර්ජාල භාවිතය (4) හරිත දළ දේශීය නිෂ්පාදිතය

32. සංවර්ධන ක්‍රියාවලියේදී රාජ්‍යයන් මුහුණපාන ගැටලු විසඳීම සඳහා ගත් සාවද්‍ය විසඳුමක් වන්නේ,
(1) දේශීය ඉතුරුම් සඳහා දිරි ගැන්වීම (2) අපනයන විවිධාංගීකරණය
(3) නව වෙළඳපොළ වසා තැබීම (4) විකල්ප බලශක්ති හඳුන්වාදීම

33. දකුණු අප්‍රිකාවේ වර්ණභේද ගැටුම අයත් වනුයේ,
(1) වාර්ගීකත්ව ගැටුමකි (2) දේශපාලනමය ගැටුමකි
(3) සමාජ ආර්ථික තත්ත්වමය ගැටුමකි (4) ආගමික මතවාද ගැටුමකි

34. සමථකරණය යොදාගත හැකි හොඳම අවස්ථාව වනුයේ,
(1) පෞද්ගලික ගැටුමකදී (2) දේපළ ආරවුලකදී
(3) ආයතන අතර ගැටුමකදී (4) කම්කරු ආරවුලකදී

35. පුද්ගලයෙකු තුළ පැවතිය යුතු සමාජයීය ගුණාංගයක් නොවන්නේ,
(1) ජය පරාජය දරා නොගැනීම (2) සහානුභූතිය
(3) යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා (4) අන් අයට ගරු කිරීම

36. දේශපාලන හා සමාජ, ආර්ථික වශයෙන් පවතින මානසික ස්වභාවයන් මුල් කරගෙන ඇතිවන ගැටුම් හඳුන්වනුයේ,
(1) අභ්‍යන්තර ගැටුම් (2) අන්තර්ජාතික ගැටුම්
(3) මතවාදී ගැටුම් (4) යුධමය ගැටුම්

37. දකුණු ආසියානික කලාපයට අයත් රටවල් එක්ව පිහිටුවා ගත් සංවිධානය හඳුන්වනු ලබන්නේ,
(1) සාර්ක් සංවිධානය (2) ආසියානු සංවිධානය
(3) කොළඹ ක්‍රමය (4) බිම්ස්ටෙක් සංවිධානය

38. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජික රටවල් තුනක් දැක්වෙන්නේ,
(1) චීනය, බ්‍රිතාන්‍ය, ලිතුවේනියාව (2) ප්‍රංශය, ඊශ්‍රායලය, ඇමරිකාව
(3) රුසියාව, ප්‍රංශය, චීනය (4) ඇමරිකාව, බ්‍රිතාන්‍යය, ඉන්දියාව

39. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල රාජ්‍ය නායක හමුව හඳුන්වනු ලබන්නේ,
(1) ආර්ථික හා සමාජ මණ්ඩලය (2) මහා මණ්ඩලය
(3) ජාත්‍යන්තර අධිකරණය (4) ලේකම් කාර්යාලය

40. විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධානයක් මෙන්ම විදේශ ආධාර සපයන ප්‍රධාන ආයතනයක් ලෙස සැලකෙනුයේ,
(1) ආසියානු සංවර්ධන බැංකුව (2) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
(3) යුරෝපා පොදු වෙළඳ හවුල (4) ගැට් සංවිධානය

ශ්‍රේෂ්ඨ අධ්‍යාපනය ශ්‍රේෂ්ඨ සංවිධානය

පුරවැසි අධ්‍යාපනය - II

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1)

i. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ප්‍රධාන ස්වරූප **දෙක** සඳහන් කරන්න.
ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව බලතල වර්ග තුනකට බෙදේ. ඉන් **දෙකක්** නම් කරන්න.
iii. වෙළඳාම සඳහා මෙරටට පැමිණි ජාතීන් **දෙකක්** ලියන්න.
iv. අර්ථ ක්‍රම ප්‍රධාන කොටස් තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.
v. ගැටුම් ඇතිවන ප්‍රධාන පාර්ශව හතරකි. ඉන් **දෙකක්** නම් කරන්න.
vi. නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් **දෙකකි**. ඒ මොනවාද?
vii. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිටි රාජ්‍ය නිලධාරීන් තිදෙනාගෙන් දෙදෙනෙකු නම් කරන්න.
viii. යුතුකම් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ. ඒවා සඳහන් කරන්න.
ix. සංවර්ධනය මනිනු ලබන ප්‍රධාන මිනුම් **දෙක** මොනවාද?
x. ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයනය කරන ප්‍රධාන රාජ්‍ය හා කිරිපිටි ආනයනය කරන ප්‍රධාන රාජ්‍ය පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 02 x 10 = 20යි)

2)

i. නූතන රාජ්‍යයන්හි මූලික වශයෙන් ආණ්ඩුක්‍රම දෙකකි. ඒවා නම් කරන්න. (ලකුණු 02 යි)
ii. දේශපාලන පක්ෂවල ස්වරූපය අනුව ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය. ඒවා නම් කරන්න.
(ලකුණු 03 යි)
iii. රාජ්‍යයේ ප්‍රධාන අංග හතරකි. ඉන් **තුනක්** නම්කර, **එකක්** කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 03 + 02 = 05 යි)

3)

i. භූමියට හා ශ්‍රමය සඳහා කරන ගෙවීම් පිළිවෙලින් ලියන්න. (ලකුණු 02 යි)
ii. ආර්ථිකයක සිදුවන ප්‍රධාන ක්‍රියාවලින් **තුන** නම් කරන්න.
(ලකුණු 03 යි)
iii. (a) නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව කොටස් තුනකි. ඉන් **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)

(b) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කිහිපයක් පවතී ඉන් **දෙකක්** නම් කර, **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 03 යි)

පුරවැසි අධ්‍යාපනය පුරා සිසුදය

4)

i. නීතියේ මූලාශ්‍ර **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)

ii. ලන්දේසි යුගයේදී මෙරට පැවැති අධිකරණ දිස්ත්‍රික්ක **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

iii. ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වය සඳහා ගෙන ඇති විධිවිධාන **තුනක්** නම් කර, ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03 + 02 = 05 යි)

5)

i. වායු දූෂණය මගින් ඇතිවන අහිතකර ප්‍රතිඵල **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

ii. සංවර්ධනය වන රටවල් මුහුණපාන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

iii. සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක වන දිළිඳු බවේ විෂම චක්‍රයේ අඩංගු කරුණු **තුනක්** සඳහන් කර ඉන් **එකක්** හැටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 + 02 = 05 යි)

6)

i. වර්තමානයේ දී තුන්වන ලෝකයේ රාජ්‍යයන් සඳහා ප්‍රබල රාජ්‍යයන්ගෙන් එල්ලවන බලපෑම් ක්ෂේත්‍ර **දෙකක්** සඳහන් කරන්න.
(ලකුණු 02 යි)

ii. බිම්ස්ටෙක් සංවිධානයේ සාමාජික රටවල් **තුනක්** නම් කරන්න.
(ලකුණු 03 යි)

iii. (a) විදේශ ආධාර සපයන රටවල් **දෙකක්** නම් කරන්න.
(ලකුණු 02 යි)
(b) ජාත්‍යන්තර වෙළඳාම තුළ භාවිත වන ප්‍රබල මුදල් ඒකක **තුනක්** සඳහන් කරන්න.
(ලකුණු 03 යි)

7)

i. මනසේ සාමය ඇතිකර ගැනීම සඳහා යොමු විය හැකි අංශ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

ii. ගැටුම් ඇති වීමට බලපාන හේතු **තුනක්** සඳහන් කරන්න.
(ලකුණු 03 යි)

iii. මැදිහත්කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංග **තුනක්** නම්කර ඉන් **එකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05 යි)

ශ්‍රේෂ්ඨ අධ්‍යාපනය ගුරු සංඝයා

11 ශ්‍රේණිය

පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

I පත්‍රය

1	03	**11**	01	**21**	02	**31**	02
2	04	**12**	02	**22**	02	**32**	03
3	03	**13**	02	**23**	02	**33**	01
4	02	**14**	02	**24**	02	**34**	04
5	01	**15**	04	**25**	03	**35**	01
6	04	**16**	01	**26**	01	**36**	03
7	03	**17**	02	**27**	01	**37**	01
8	01	**18**	01	**28**	01	**38**	03
9	04	**19**	04	**29**	04	**39**	02
10	02	**20**	04	30	03	**40**	02

(ලකුණු 01 x 40 = 40 යි)

II පත්‍රය

1)

i.

- සෘජු ප්‍රජාතන්ත්‍රවාදය
- වක්‍ර/ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය

ii.

- I වන ලැයිස්තුව (පළාත් සභා ලැයිස්තුව)
- II වන ලැයිස්තුව (සංවෘත ලැයිස්තුව)
- III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව)

iii.

- අරාබි ජාතිකයින්
- ඉන්දියානුවන්
- චීන ජාතිකයින්
- යුරෝපා ජාතීන්

iv.

- ධනවාදී අර්ථ ක්‍රමය
- සමාජවාදී අර්ථ ක්‍රමය
- මිශ්‍ර අර්ථ ක්‍රමය

පුරවැසි අධ්‍යාපනය ගුරු සංසදය

v.

- පුද්ගලයා තුළ
- පුද්ගලයින් අතර
- ජන කණ්ඩායම් අතර
- රටවල් අතර

vi.

- දේශීය නීතිය
- අන්තර්ජාතික නීතිය

vii.

- රාජ්‍ය ලේකම්
- මුදල් ලේකම්
- නීති ලේකම්

viii.

- නීතිමය යුතුකම්
- සදාචාරාත්මක යුතුකම්

ix.

- සාම්ප්‍රදායික
- නූතන

x.

- ඇමරිකා එක්සත් ජනපදය
- නවසීලන්තය

2) .

i.

- පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය
- ජනාධිපති ආණ්ඩු ක්‍රමය

ii.

- බහුපක්ෂ
- ද්විපක්ෂ
- ඒකපක්ෂ

iii.

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපත්‍යය බලය

ලංකාවේ අධ්‍යාපනය ගුරු සංසදය

3)

i.

- බදු
- වැටුප්

ii.

- නිෂ්පාදනය
- බෙදා හැරීම
- පරිභෝජනය

iii. (a)

- පරිභෝගික භාණ්ඩ
- අන්තර් භාණ්ඩ
- ප්‍රාග්ධන භාණ්ඩ

(b)

- වැඩ ලෝකය පුළුල් වීම.
- ගෝලීය වෙළඳපොල පුළුල් වීම.
- ලෝකයේ ඕනෑම රටක ජීවත් විය හැකිවීම.
- තම දක්ෂතා හා හැකියා අනුව වෙනත් රටක සේවය කිරීමට හැකිවීම.
- අඩු මිලට ශ්‍රමය ලබා ගත හැකි රටවලට කර්මාන්ත සංක්‍රමණය වීම.

4)

i.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- විවිධ අනපනත්
- අධිකරණ තීන්දු
- නීති විශාරදයින්ගේ මත
- සිරිත් විරිත්
- ආගම

ii.

- කොළඹ
- යාපනය
- ගාල්ල

iii.

- විනිසුරුවන් පත් කිරීමේ ක්‍රමය
- විනිසුරුවන් ඉවත් කිරීමේ ක්‍රමය
- විනිසුරුවන්ගේ වැටුප් ගෙවීම් ආකාරය වෙනත් තනතුරු ** අනවශ්‍ය මැදිහත්වීම් හා පාලනය කිරීම් සීමා අධිකරණ සේවා කොමිෂමක් පිහිටුවීම

පුවැසි අධ්‍යාපනය ශ්‍රේෂ්ඨ සංසදය

5)

i.

- ගෝලීය උණුසුම ඉහළ යෑම.
- ඕසෝන් ස්ථාරයට හානි වීම
- අම්ල වැසි ඇතිවීම.
- දූවිලි වළා ඇතිවීම.
- දේශගුණික විපර්යාස
- හිම කඳු දියවීම.
- මුහුදු මට්ටම ඉහළ යාම.
- ලෙඩ රෝග හා වසංගත ව්‍යාප්ත වීම

ii.

- ප්‍රාග්ධන ඌනතාව
- ප්‍රාථමික භාණ්ඩ මිල උච්චාවචනය
- ආනයනය කරන භාණ්ඩ සඳහා ඉහළ මිලක් ගෙවීම
- අවාසිදායක වෙළඳ ශේෂය සංවර්ධන රටවල් අනුගමනය කරන *ආරක්ෂක

iii.

- අඩු ආදායම
- ඉහළ පාරිභෝජන වියදම
- ඉතුරුම් අඩුවීම
- ප්‍රාග්ධන අඩුවීම
- නිෂ්පාදනය අඩුවීම

6)

i.

- අන්තර්ජාතික වෙළඳාම
- ණය හා ආධාර දීම
- ආර්ථික සංවර්ධනය
- ආරක්ෂක ක්ෂේත්‍රය රැකියා සැපයීම

ii.

- බංගලාදේශය
- ඉන්දියාව
- මියන්මාරය
- ශ්‍රී ලංකාව
- තායිලන්තය

iii. (a)

- ඇමරිකා එක්සත් ජනපදය
- එංගලන්තය
- ජපානය
- ඉන්දියාව

iv. (b)

- ඇමෙරිකානු ඩොලර්
- ස්ටර්ලින් පවුම්
- යුරෝ

සුරවැසි අධ්‍යාපනය ගුරු සංසදය

- ජපන් යෙන්

7) .

i.

- ආගමික වතාවත් කෙරෙහි යොමු වීම.
- මනෝවිද්‍යාත්මක අභ්‍යාස මඟින්
- උපදේශනය මගින්
- ස්වභාවික පරිසරය නිරීක්ෂණය මගින්

ii.

- විවිධ ප්‍රතිරූප
- වෙනත් අදහස් සීමා ඇතිවීම
- අවහිරතා ඇතිවීම
- මානසික තත්ත්ව
- පරමාර්ථ ඉටු නොවීම

iii.

- හොඳ සවන් දෙන්නෙකු වීම
- විශ්වාසවන්ත භාවය
- කැපවීම
- අවංක වීම
- අපක්ෂපාතීත්වය
- මධ්‍යස්ථභාවය
- විචාරශීලී හා නිර්මාණශීලී බව

පුරවැසි අධ්‍යාපනය ගුරු සංසදය